කාර්ගිල්ස් බෑන්ක් පීඑල්සී - හලාවත ශාඛාව

1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ගනුදෙනුකරුගේ නම :- වික්‍රම ආරච්චිගේ උදිත හර්ෂණ වික්‍රමසිංහ

ලියාපදිංචි අංක : PQ00293614 දරන කාර්ගිල්ස් බෑන්ක් පීඑල්සී (ලියාපදිංචි අංක PB 4847 දරන කාර්ගිල්ස් බෑන්ක් ලිමිටඩ් ලෙස පෙර හැඳින්වූ) හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2026/09/28 වන දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම්, වික්‍රම ආරච්චිගේ උදිත හර්ෂණ වික්‍රමසිංහ බන්ධනදායි වශයෙන් කොළඹ 3, ගාලු පාර, අංක 696 හි ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටි කාර්ගිල්ස් බෑන්ක් පීඑල්සී (මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) නමට ප්‍රසිද්ධ නොතාරිස් ඒ.සී.එස්. පෙරේරා විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2020/10/05 දිනැති අංක 9196, වර්ෂ 2020/10/05 දිනැති අංක 9198 සහ වර්ෂ 2022/10/22 දිනැති අංක 9491 දරන උකස් බැඳුම්කර මගින් මෙහි පළමු සහ දෙවන උපලේඛනවල මැනවින් විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍රය උකස් කොට බැඳ තබා ප්‍රදානය කරන ලද ණය පහසුකම මත ගෙවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී අංක 9196, 9198 සහ 9491 දරන උකස් බැඳුම්කර මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක් 2026/06/30 දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් එක්කෝටි හැටනව ලක්ෂ හැත්තෑ නවදහස් එකසිය විසිඅටයි ශත හැත්තෑවක (රු.16,979,128.70) මුදලක් සහ එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරනු ලබන තෙක් 2026/07/01 දින සිට රු.16,284,238.92 ක මුදල මත වර්ෂයකට 14.5% ක පොළියක්ද, බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින්ද,

සහ

සම්පූර්ණ මුදල ගෙවා අවසන් වන තෙක් රුපියල් දස ලක්ෂ පහළොස් දහස් නවසිය විසි තුනයි ශත හැත්තෑ හතක (රු.1,015,923.77) මුදලක් ද බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ.

ඒ කෙසේද යත්,

එකී 9196, 9198 සහ 9491 දරන උකස්කර යටතේ අයවිය යුතු එකී රුපියල් එක්කෝටි හැත්තෑ නවලක්ෂ අනූපන් දහස් පනස් දෙකයි ශත හතළිස් හතක (රු.17,995,052.47) මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය

යුතු පොළිය ද, ගාස්තු ද වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල්ද (ඒ වන විට යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල් අඩු කොට) අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත වික්‍රම ආරච්චිගේ උදිත හර්ෂණ වික්‍රමසිංහ බන්ධනදායි වශයෙන් උකස්කර ඇති දේපල, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට හෝමාගම, පනාගොඩ, සර්වෝදය මාවත, හයිලෙවල් පාර, අංක 9-I දරන ස්ථානයහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන්දිමා ප්‍රියදර්ශනී ගමගේ වෙත වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

පළමු උපලේඛනය

අංක 9198 සහ 9491 දරන බැඳුම්කර අනුව

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, පිටිගල් කෝරළේ මුන්නේස්සරම් පත්තුවේ, හලාවත ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, මුගුණුවටවන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ මුගුණුවටවන ග්‍රාමයෙහි පිහිටි ''මූනගන්දලුව''නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්.කේ.එම්.එස්.ප්‍රියංකර විසින් මැන සාදන ලද අංක 7002 සහ 2019 ජූලි මස 15 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන්කරන ලද කැබැලි අංක 01 දරන කැබැල්ලට මායිම් : උතුරට : බලයලත් මිනින්දෝරු ඒ.ජී.එස්.බී.පරාක්‍රම විසින් මැන සාදන ලද අංක 616/B දරන පිඹුරේ කැබලි අංක 2D ද; නැගෙනහිරට : ප්‍රාදේශීය සභා පාර ද; දකුණට : ඉහත කී 616/B පිඹුරේ කැබැලි අංක 2B ද; සහ බස්නාහිරට : බලයලත් මිනින්දෝරු එච්.එස්.පෙරේරා විසින් මැන සාදන ලද අංක 84/1977 දරන පිඹුරේ කැබලි අංක 3 ද; ඉහත කී පිඹුරු අංක 7002 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් රූඩ් දෙකක් (A0, R2, P0) වන ඉඩම් කොටස සහ ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ සියලුම දේ වන අතර මෙම ඉඩම හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුමේ/පත්ඉරු අංක A 142/114 හි ලියාපදිංචි කර ඇත.

තව ද බලයලත් මිනින්දෝරු A.G.S.B. පරාක්‍රම විසින් මැන සාදන ලද අංක 616/B සහ 1984.03.10 දරන පිඹුරෙහි කැබලි අංක 2C හි නැගෙනහිර මායිම ඔස්සේ මාර්ගයක් ලෙස භාවිතා කිරීමේ අයිතිය ද සමඟ වේ.

දෙවන උපලේඛනය

අංක 9196 බැඳුම්කරය අනුව

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, පිටිගල් කෝරළේ, යාගම් පත්තුවේ, හලාවත ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, කොක්කාවිල අංක 549 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ කොක්කාවිල සහ පුලියන්කඩවර ග්‍රාමයෙහි පිහිටි ''සෙල්වමින් එස්ටේට්'' නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්.ශ්‍රීදරන් විසින් මැන සාදන ලද අංක 7870 සහ 2019 **මාර්තු මස** 18 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන්කරන ලද කැබැලි අංක 03 දරන කැබැල්ලට මායිම් : උතුරට : කැබලි අංක 01 සහ 02 ද; නැගෙනහිරට: කපිලට අයත් ඉඩම සහ නිකලස්ගේ උරුමකරුවන්ට අයත් ඉඩම ද; දකුණට : වෛද්‍ය ප්‍රේමරත්නගේ උරුමකරුවන්ට අයත් ඉඩම සහ බලයලත් මිනින්දෝරු එස්. ශ්‍රීදරන් විසින් මැන සාදන ලද අංක 6377 දරන පිඹුරේ කැබලි අංක 2 ද සහ බස්නාහිරට: බලයලත් මිනින්දෝරු එස්. ශ්‍රීදරන් විසින් මැන සාදන ලද අංක 6377 දරන පිඹුරේ කැබලි අංක 2, පාරක් සඳහා වෙන්කරන බලයලත් මිනින්දෝරු එස්. ශ්‍රීදරන් විසින් මැන සාදන ලද අංක 6377 දරන පිඹුරේ කැබලි අංක 1 සහ අඩි 12ක් පළල පුද්ගලික පාර ද ඉහත කී පිඹුරු අංක 7870 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් රූඩ් එකයි, පර්චස් තිස්හතරයි දශම පහක් (A0, R1, P34.5) වන ඉඩම් කොටස සහ ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ සියලුම දේ වන අතර මෙම ඉඩම හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුමේ/පත්ඉරු අංක A 138/42 හි ලියාපදිංචි කර ඇත.

තව ද අඩි 12ක් පළල පාරක් සඳහා වෙන්කරන ලද බලයලත් මිනින්දෝරු එස්. ශ්‍රීදරන් විසින් මැන සාදන ලද අංක 6377 දරන පිඹුරේ කැබලි අංක 1 සහ බලයලත් මිනින්දෝරු එස්. ශ්‍රීදරන් විසින් මැන සාදන ලද අංක 7870 දරන පිඹුරේ දැක්වෙන අඩි 12ක් පළල පුද්ගලික පාර මාර්ගයක් ලෙස භාවිතා කිරීමේ අයිතියද සමඟ වේ.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

වම්ලා අබේසූරිය,
අංශ ප්‍රධානි - අයකර ගැනීම්.

10 - 730

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

ජෝන් පෝල් ඉරුගල්බණ්ඩාරගේ ගොවින් වත්සුක ඉරුගල් බණ්ඩාර
ඉම්පීරියල් ඔටෝ කෙයා හි තනි අයිතිකරු

2026 ක් වූ සැප්තැම්බර් මස 04 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 82 දරන සහ කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 479 හි එහි ලියාපදිංචි කාර්යාලය පිහිටි හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී හි වාසියට ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. දිසානායක විසින් ලියා සහතික කරන ලද 2022.03.09 දිනැති අංක 151 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කර බැඳ තබා ඇති මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍ර ඇප වශයෙන් තබා ගනිමින් ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම ඉම්පීරියල් ඔටෝ කෙයා හි තනි අයිතිකරු වන ජෝන් පෝල් ඉරුගල්බණ්ඩාරගේ ගොවින් වත්සුක ඉරුගල් බණ්ඩාර ණයකරු වශයෙන් සහ පරණමාන්නගේ තරංගි බහුෂ්රානි මේබලා ඉරුගල්බණ්ඩාර *විවාහයට පෙර* ගුණසේකර උකස්කරු වශයෙන් පැහැර හැර තිබේ.

ඒ අනුව දැන් එකී අංක 151 දරන බැඳුම්කරය මත 2026 ජුනි මස 09 වැනි දිනට එකී පහසුකම්වල සම්පූර්ණ හිඟ මුදල වන, ශ්‍රී ලංකා වලංගු මුදලින් රු. 23,985,468.35 (රුපියල් මිලියන විසි තුනයි නව ලක්ෂ අසූ පන් දහස් හාරසිය හැට අටයි ශත තිස් පහ) ක මුදලක් එකී හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති අතර, ඒ අනුව, මුදල් ලැබෙන තුරු කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, එකී ණය පහසුකම මත අයවිය යුතු සම්පූර්ණ ණය ගෙවා නිමකරන දිනය දක්වා, 2026 ජුනි මස 10 දින සිට රු. 17,046,000.00ක වාරික ණය I පහසුකම සඳහා සම්පූර්ණ හිඟ ප්‍රාග්ධන මුදල වන රුපියල් මිලියන පහළොවයි හාර ලක්ෂ දහසය දහසක් (රු. 15,416,000.00) මත වර්ෂයකට AWPLR+3% ක අනුපාතයට තවදුරටත් පොළිය සහ 2026 ජුනි මස 10 දින සිට රු. 5,726,000.00 ක වාරික ණය II පහසුකම සඳහා සම්පූර්ණ හිඟ ප්‍රාග්ධන මුදල වන රුපියල් මිලියන පහයි දෙලක්ෂ හැත්තෑ හය දහස (රු. 5,276,000.00) මත වර්ෂයකට 12%ක අනුපාතයට තවදුරටත් පොළිය සමග ශ්‍රී ලංකා වලංගු මුදලින් රු. 23,985,468.35 (රුපියල් මිලියන විසි තුනයි නව ලක්ෂ අසූ පන් දහස් හාරසිය හැට අටයි ශත තිස් පහ) ක මුදලක් සහ ප්‍රවාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකරගැනීම සඳහා, එකී ණය පහසුකම සඳහා එකී අංක 151 දරන බැඳුම්කරය මගින් ඇප වශයෙන් තබන ලද සහ ඉහත කී හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍ර, බලයලත් වෙන්දේසිකරු වන ජේ. ඩබ්. ඊ. ජයවර්ධන මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ ඉහත කී හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම් පත්තුවේ, තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ තිස්සමහාරාම ප්‍රාදේශීය සභා සීමාව තුළ කාවන්තිස්සපුර ග්‍රාම නිලධාරී වසම තුළ කුන්කුඹියාකන්ද, බෝගහපැලැස්සේ පිහිටි ඉඩමට සර්වේ ජනරාල්වරයා විසින් සහතික කරන ලද අංක අ භූ පි 2 දරන පිඹුරේ දැක්වෙන ලොට් 907 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන් : උතුරට : ලොට් 902 ද; නැගෙනහිරට : ප්‍රධාන පාර සඳහා වෙන් කිරීම ද; දකුණට : ලොට් 908 සහ බස්නාහිරට : ලොට් 945 ද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් තුනයි පර්චස් විසි හය (අ.1., රූ.3., පර්.26)ක් විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේ ද සමග වේ.

සර්වේ ජනරාල්වරයා විසින් සහතික කරන ලද අංක අ භූ පි 2 දරන පිඹුරේ දැක්වෙන මාර්ග අයිතීන් ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ශිරෝමි හල්ලොලුව,
මාණ්ඩලික ලේකම්.

10 - 649/1

හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

නාවල අධිකාරිගේ ඇන්ටන් කුරේරා සහ කිරිහෙට්ටි හෙන්රීටා දමයන්ති ලියනගේ

2026ක් වූ සැප්තැම්බර් මස 04 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 82 දරන සහ කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 479 හි එහි ලියාපදිංචි කාර්යාලය පිහිටි හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී හි වාසියට ප්‍රසිද්ධ නොතාරිස් ජී. එම්. එම්. ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද 2017.02.15 දිනැති අංක 5728 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කර බැඳ තබා ඇති මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය ඇප වශයෙන් තබා ගනිමින් ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම නාවල අධිකාරිගේ ඇන්ටන් කුරේරා සහ කිරිහෙට්ටි හෙන්රීටා දමයන්ති ලියනගේ ණයකරුවන් වශයෙන් පැහැර හැර තිබේ.

ඒ අනුව දැන් එකී අංක 5728 දරන බැඳුම්කරය මත 2026 මැයි මස 25 වැනි දිනට එකී පහසුකමේ සම්පූර්ණ හිඟ මුදල වන, ශ්‍රී ලංකා වලංගු මුදලින් රු. 17,994,033.87 (රුපියල් මිලියන දහහතයි නව ලක්ෂ අනූ හතර දහස් තිස් තුනයි ශත අසූ හතක) මුදලක් එකී හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති අතර, ඒ අනුව, මුදල් ලැබෙනතුරු කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, එකී ණය පහසුකම මත අයවිය යුතු සම්පූර්ණ ණය ගෙවා නිමකරන දිනය දක්වා 2026 මැයි මස 26 දින සිට රුපියල් මිලියන එකොළහයි පන් ලක්ෂ විසි දහස (රු. 11,520,000.00) ක මුදල මත 15.5%ක අනුපාතයට

තවදුරටත් පොළිය ද සමග ශ්‍රී ලංකා වලංගු මුදලින් ඉහත කී රු. 17,994,033.87 (රුපියල් මිලියන දහහතයි නව ලක්ෂ අනූ හතර දහස් තිස් තුනයි ශත අසූ හත)ක එකී මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකරගැනීම සඳහා, එකී ණය පහසුකම සඳහා එකී අංක 5728 දරන බැඳුම්කරය මගින් ඇප වශයෙන් තබන ලද සහ ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය, බලයලත් වෙන්දේසිකරු වන පී. කේ. ඊ. සේනාපති මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) අලුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කටාන ප්‍රාදේශීය සභාවේ, කටාන උප කාර්යාල සීමාව තුළ 70 - පහල කඳවල ග්‍රාම නිලධාරී වසම තුළ පහල කඳවල ගමේ පිහිටි "හොරගහලන්දේකැබැල්ල, හොරකගහවතුකැබැල්ල, හොරගහලන්ද, හොරකගහවත්ත සහ හොරගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. එන්. කොඩිකාර විසින් සාදන ලද අංක 435 සහ 2011.10.19 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් ඒ වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : රණවිරු හේරත් මාවත සහ බලයලත් මිනින්දෝරු පී. එන්. කොඩිකාර විසින් සාදන ලද අංක 332 හා 2010.11.08 දින දරන පිඹුරේ ලොට් ඒ ද; නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු පී. එන්. කොඩිකාර විසින් සාදන ලද අංක 332 හා 2010.11.08 දින දරන පිඹුරේ ලොට් ඒ සහ එම්. නිමල් රූපසිංහ, දිනූෂා සුදර්ශනී සහ තවත් අය හිමිකම්පාන ලද ඉඩම් ද; දකුණට : ජේ. ඒ. දෝන සුනීතා හිමිකම්පාන ලද ඉඩම සහ බස්නාහිරට : ජේ. ඒ. දොන් ජූඩ් නිමල්සිරි හිමිකම්පාන ලද ඉඩම සහ පෞද්ගලික පාර ද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් විසි පහයි දශම තුනයි බිංදුව (අ.1, රූ.0, පර්. 25.30)ක් විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේ ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ශිරෝමි හල්ලොලුව,
මාණ්ඩලික ලේකම්.

10 - 649/2

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

මහමාලගේ තිලක් ජයතු ප්‍රනාන්දු සහ කුරුණගේ මේරි තනූජා කාංචනා පෙරේරා
ජයාස් ට්‍රේඩින් කන්සර්න් හි හවුල්කරුවන්

2026 ක් වූ සැප්තැම්බර් මස 04 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 82 දරන සහ කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 479 හි එහි ලියාපදිංචි කාර්යාලය පිහිටි හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට මහමාලගේ තිලක් ජයතු ප්‍රනාන්දු විසින් උකස්කර ඇති ප්‍රසිද්ධ නොතාරිස් එම්. ටී. ඒ. එල්. සමරදිවාකර විසින් ලියා සහතික කරන ලද 2025.06.11 දිනැති අංක 1515 දරන උකස් බැඳුම්කරය සහ 2025.12.12 දිනැති අංක 1626 දරන උකස් බැඳුම්කරය, (මෙහි පළමුවන උපලේඛනයේ දක්වා ඇති) 2025.06.11 දිනැති අංක 1516 දරන උකස් බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ටී. ඒ. එල්. සමරදිවාකර විසින් ලියා සහතික කරන ලද 2025.12.12 දිනැති අංක 1627 දරන උකස් බැඳුම්කරය, (මෙහි දෙවන උපලේඛනයේ දක්වා ඇති) 2025.06.11 දිනැති අංක 1517 දරන උකස් බැඳුම්කරය සහ 2025.12.12 දිනැති අංක 1628 දරන උකස් බැඳුම්කරය (මෙහි තුන්වන උපලේඛනයේ දක්වා ඇති) මගින් උකස්කර බැඳ තබා ඇති එකී උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍ර සුරක්ෂිතයන් වශයෙන් තබා ගනිමින් ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම ජයාස් ට්‍රේඩින් කන්සර්න් හි හවුල්කරුවන් වන මහමාලගේ තිලක් ජයතු ප්‍රනාන්දු සහ කුරුණගේ මේරි තනූජා කාංචනා පෙරේරා ණයකරුවන් වශයෙන් පැහැර හැර තිබේ.

ඒ අනුව දැන් එකී අංක 1515, 1626, 1516, 1627, 1517 සහ 1628 දරන බැඳුම්කර මත 2026 මැයි මස 14 වැනි දිනට එකී පහසුකමේ සම්පූර්ණ හිඟ මුදල වන, ශ්‍රී ලංකා වලංගු මුදලින් රු. 386,454,735.38 (රුපියල් මිලියන තුන්සිය අසූ හයයි හාර ලක්ෂ පනස් හතර දහස් හත්සිය තිස් පහයි ශත තිස් අට) ක මුදලක් එකී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති අතර, ඒ අනුව, මුදල් ලැබෙනතුරු කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, එකී අංක 1515, 1626, 1516, 1627, 1517 සහ 1628 දරන බැඳුම්කර මත අයවිය යුතු සම්පූර්ණ ණය ගෙවා නිමකරන දිනය දක්වා, 2026 මැයි මස 15 දින සිට රු. 371,400,000.00 (රුපියල් මිලියන තුන්සිය හැත්තෑ එකයි හාර ලක්ෂය)ක මුදලක් මත මුල් මාස 12 සඳහා වර්ෂයකට 10%ක අනුපාතයට සහ ඉන් අනතුරුව AWPLR + 2%ක අනුපාතයට වැඩිපුර පොළිය ද සමග ශ්‍රී ලංකා වලංගු මුදලින් රු. 386,454,735.38 (රුපියල් මිලියන තුන්සිය අසූ හයයි හාර ලක්ෂ පනස් හතර දහස් හත්සිය තිස් පහයි ශත තිස් අට) ක එකී මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකරගැනීම සඳහා, එකී ණය පහසුකම් සඳහා එකී අංක 1515, 1626, 1516, 1627, 1517 සහ 1628 දරන බැඳුම්කර මගින් සුරක්ෂිතයන් වශයෙන් තබන ලද සහ ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද මෙහි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍ර, බලයලත් වෙන්දේසිකරු වන කේ. පී. එන්. සිල්වා මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින්

ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කොළඹ මහනගර සභා සීමාව තුළ, කොටුව ග්‍රාම නිලධාරී වසම තුළ පිටකොටුවේ පිහිටි වයිනා පටුමග, වරිපනම් අංක 15 සහ 15/1/1 දරන ඉඩමට බලයලත් මිනින්දෝරු ඊ. එම්. ඇන්තනීස් විසින් සාදන ලද අංක 3761 සහ 1941 මැයි මස 12 දින දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : වරිපනම් අංක 218 සහ 220 - බංගසාල වීදිය දරන පරිශ්‍රය ද; නැගෙනහිරට : වරිපනම් අංක 19, වයිනා පටුමග දරන පරිශ්‍රය ද; දකුණට : වයිනා පටුමග සහ බස්නාහිරට : වරිපනම් අංක 11 - වයිනා පටුමග දරන පරිශ්‍රය ද මායිම් වූ එකී අංක 3861 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් පහයි සියයෙන් හැත්තෑ අට (අ.0., රූ.0., පර්. 5 78/100)ක් විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේ ද සමග වේ.

ඉහත කී දේපළ මෑතක දී කරන ලද මැනීමකට අනුව පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කොළඹ මහනගර සභා සීමාව තුළ, කොටුව ග්‍රාම නිලධාරී වසම තුළ පිටකොටුවේ පිහිටි වයිනා පටුමග, වරිපනම් අංක 15 සහ 15/1/1 දරන ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. පී. ඒ. ශාන්ත ප්‍රිය පෙරේරා විසින් සාදන ලද අංක 7561 සහ 2003 පෙබරවාරි මස 02 දින දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන් : උතුරට : වරිපනම් අංක 218 සහ 220 - බංගසාල වීදිය දරන පරිශ්‍රය ද; නැගෙනහිරට : වරිපනම් අංක 11, වයිනා පටුමග දරන පරිශ්‍රය ද; දකුණට : වයිනා පටුමග සහ බස්නාහිරට : වරිපනම් අංක 11 - වයිනා පටුමග දරන පරිශ්‍රය ද මායිම් වූ එකී 7561 - දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් පහයි දශම හතයි අට (අ.0., රූ.0., පර්.5.78)ක් විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේ ද සමග වේ.

ඉහත කී දේපළ මෑතක දී කරන ලද මැනීමකට අනුව පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කොළඹ මහනගර සභා සීමාව, අංක 20 කොට්ඨාසය තුළ සහ වයිනා පටුමග කොට්ඨාසය තුළ සහ කොටුව ග්‍රාම නිලධාරී වසම තුළ පිටකොටුවේ වයිනා පටුමගේ පිහිටි වයිනා පටුමග, වරිපනම් අංක 15 සහ 15/1/1 දරන ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. පී. ඒ. ශාන්ත ප්‍රිය පෙරේරා විසින් සාදන ලද අංක 5345 සහ 2019 දෙසැම්බර් මස 11 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 1 (බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් සාදන ලද අංක 7561 සහ 2003 පෙබරවාරි මස 02 දින දරන පිඹුරේ දැක්වෙන ඉඩම නැවත මැනීමකි) වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන් : උතුරට : වරිපනම් අංක 218 සහ 220 - බංගසාල වීදිය දරන පරිශ්‍රය සහ වරිපනම් අංක 11 - වයිනා පටුමග දරන පරිශ්‍රය ද; නැගෙනහිරට : වරිපනම් අංක 19, වයිනා පටුමග දරන පරිශ්‍රය ද; දකුණට : වයිනා පටුමග (එම්සී) සහ වරිපනම් අංක 11 - වයිනා පටුමග දරන පරිශ්‍රය සහ බස්නාහිරට : වරිපනම් අංක 11 - වයිනා පටුමග දරන පරිශ්‍රය ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් පහයි දශම හතයි අට (අ.0, රූ.0, පර්.5.78) ක් විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේ ද සමග වේ.

දෙවන උපලේඛනය

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (නමුත් මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ), අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ වත්තල ප්‍රාදේශීය සභාවේ, පමුණුගම උප කාර්යාල සීමාව තුළ, 193ඒ - දෑලතුර නැගෙනහිර ග්‍රාම නිලධාරී වසම තුළ දෑලතුර පිහිටි "බදුල්ලගහවත්තේ කොටස, මැදගොඩවත්තේ කුඹුර, මැදගොඩවත්තේ කුඹුරුකට්ටිය" නමැති දැන් එක් ඉඩමක් වශයෙන් ගෙන "අඹගහවත්ත" යනුවෙන් හඳුන්වන ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. පී. ඒ. එස්. පී. පෙරේරා විසින් සාදන ලද අංක 5205 සහ 2019 ජූලි මස 18 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 1 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන් : උතුරට: පාර (මාර්ග සංවර්ධනය අධිකාරිය) සහ කේ. පී. පෙරේරා හිමිකම්පාන ඉඩම ද; නැගෙනහිරට : කේ. වී. ආර්. පෙරේරා හිමිකම්පාන ඉඩම සහ බී. රොද්‍රිගු හිමිකම්පාන මෙහි ලොට් 2 දරන ඉඩම ද; දකුණට : මෙහි ලොට් 2 සහ කේ. ආර්. පෙරේරා සහ තවත් අය හිමිකම්පාන ඉඩම සහ බස්නාහිරට : කේ. පී. පෙරේරා සහ තවත් අය හිමිකම්පාන ඉඩම සහ පාර (මාර්ග සංවර්ධන අධිකාරිය) ද මායිම් වූ එකී අංක 5205 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් විසි නවයයි දශම තුන (අ.1, රූ.0, පර්.29.3) ක් විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේ ද සමග වේ.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (නමුත් මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ), අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ වත්තල ප්‍රාදේශීය සභාවේ, පමුණුගම උප කාර්යාල සීමාව තුළ, 193ඒ - දෑලතුර නැගෙනහිර ග්‍රාම නිලධාරී වසම තුළ දෑලතුර පිහිටි "බදුල්ලගහවත්තේ කොටස, මැදගොඩවත්තේ කුඹුර, මැදගොඩවත්තේ කුඹුරුකට්ටිය" නමැති දැන් එක් ඉඩමක් වශයෙන් ගෙන "අඹගහවත්ත" යනුවෙන් හඳුන්වන ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. පී. ඒ. එස්. පී. පෙරේරා විසින් සාදන ලද අංක 5205 සහ 2019 ජූලි මස 18 දින දරන පිඹුරේ ලොට් 2 වශයෙන් දැක්වෙන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන් : උතුරට: මෙහි ලොට් 1 සහ කේ. පී. පෙරේරා හිමිකම්පාන ලද ඉඩම ද; නැගෙනහිරට :

බී. රොද්‍රිගු හිමිකම්පාන ලද ඉඩම ද; දකුණට : කේ. ආර්. පෙරේරා සහ තවත් අය හිමිකම්පාන ලද ඉඩම සහ බස්නාහිරට : කේ. ආර්. පෙරේරා සහ තවත් අය හිමිකම්පාන ලද ඉඩම සහ මෙහි ලොට් 1 ද මායිම් වූ එකී අංක 5205 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසි හතයි දශම නවය (අ.0, රූ.1, පර්.27.9)ක් විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේ ද සමග වේ.

තුන්වන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ වත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ 166ඒ - කුංඡාවත්ත ග්‍රාමනිලධාරී වසම තුළ නුගපේ පිහිටි දැන් වරිපනම් අංක 261/16 - නුගපේ පාර දරන "කැබැල්ලගහ ඕවිට, කුඹුක්ගහ ඕවිට සහ කුඹුක්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. පෙරේරා විසින් සාදන ලද අංක 3778 සහ 1998 සැප්තැම්බර් මස 04 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 39 සහ 40 වශයෙන් ලකුණු කරන ලද යාබදව පිහිටි ඉඩම් කොටස්වලට මායිම් වශයෙන් : උතුරට : ලොට් 50 (අඩි 20ක පාර සඳහා වෙන් කිරීම) සහ ලොට් 38 ද; නැගෙනහිරට : හෙන්රි පෙරේරාගේ මුතුරාජවෙල ද; දකුණට : ඩී. ජේ. ඒ. සුනිල් රොද්‍රිගුගේ ඉඩම සහ බස්නාහිරට : ලොට් 41 සහ ලොට් 50 (අඩි 20ක පළල පාර සඳහා වෙන් කිරීම) ද මායිම් වූ එකී අංක 3778 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් විසි හතරයි දශම පහයි බිංදුව (අ.0, රූ.0, පර්.24.50)ක් විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේ ද සමග වේ.

ඉහත කී දේපළ මැනක දී කරන ලද මැනීමකට අනුව පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ වත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ 166ඒ - කුංඡාවත්ත ග්‍රාමනිලධාරී වසම තුළ නුගපේ පිහිටි දැන් වරිපනම් අංක 261/16 - නුගපේ පාර දරන "කැබැල්ලගහ ඕවිට, කුඹුක්ගහ ඕවිට සහ කුඹුක්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. පී. ඒ. එස්. පී. පෙරේරා විසින් සාදන ලද අංක 5309 සහ 2019 ඔක්තෝබර් මස 08 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 1 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන් : උතුරට : පාර (ප්‍රා. ස.) සහ එකී අංක 3778 දරන පිඹුරේ ලොට් 38 ද; නැගෙනහිරට : හෙන්රි පෙරේරා හිමිකම්පාන ඉඩම ද; දකුණට : ඩී. ටී. ඒ. සුනිල් රොද්‍රිගුගේ හිමිකම්පාන ඉඩම සහ බස්නාහිරට : එකී අංක 3778 දරන පිඹුරේ ලොට් 41 සහ පාර (ප්‍රා. ස.) ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් විසි තුනයි දශම අට (අ.0, රූ.0, පර්. 23.8)ක් විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේ ද සමග වේ.

බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. පෙරේරා විසින් සාදන ලද අංක 3778 සහ 1998 සැප්තැම්බර් මස 04 දින දරන පිඹුරේ ලොට් 50 (අඩි 20ක් පළල පාර සඳහා වෙන් කරන ලද) මතින් හා ඔස්සේ වන මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ශිරෝමි හල්ලොලුව,
මාණ්ඩලික ලේකම්.

10 - 649/3

නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී

සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මතය

2026 අගෝස්තු මස 19 දින කොළඹ දී පවත්වන ලද නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී පහත දැක්වෙන යෝජනා සම්මතය විශේෂයෙන්ම සහ ඒකමනිකව සම්මත කරන ලදී. එනම් ;

නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී ("බැංකුව") ආයතනය වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එව්. ආර්. ඊ. ජී. හේරත් විසින් සහතික කරන ලද 2019.03.01 දින අංක 615 දරන උකස් බැඳුම්කරය මගින් සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඊ. එස්. කේ. උඩුවරාගොඩ විසින් සහතික කරන ලද පිළිවෙළින් 2020.03.11 දින සහ 2020.09.02 දින අංක 174 සහ අංක 223 දරන උකස් බැඳුම්කර මගින් උකස් කර පවරා දෙන ලද මෙහි උපලේඛනයේ සවිස්තරාත්මකව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍ර ඇපයට තබා එයට එරෙහිව ප්‍රදානය කරන ලද ණය මුදල්/පහසුකම් මත අයවිය යුතු මුදල් ආපසු ගෙවීම (මෙහි "පළමු බන්ධනදායී" යන යෙදුමට හෝ ප්‍රකාශයට පද සම්බන්ධය අනුව ඕරා ඉවෙන්ට් සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම, එහි අනුප්‍රාප්තිකයන් හා පැවරුම්ලාභීන් අවශ්‍යවන හෝ පිළිගනු ලබන, අදහස් කරන සහ ඇතුළත් වන මෙහි මින්මතු "පළමු බන්ධනදායී" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 261/1/C, කොටුන්න පාර, බියගම දරන ස්ථානයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තා වූ ද, ලියාපදිංචි අංක PV 88181 යටතේ සංශෝධිත 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වන්නා වූ ද, ඕරා ඉවෙන්ට් සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම විසින් සහ (මෙහි දෙවන බන්ධනදායී යන යෙදුමට හෝ ප්‍රකාශයට පද සම්බන්ධය අනුව හිඟපුරගේ බුද්ධික අනුර කුමාර යන අය ඔහුගේ උරුමක්කරුවන්, පොල්මඃකරුවන්, අද්මිනිස්ත්‍රාසිකරුවන් සහ පැවරුම්ලාභීන් අවශ්‍ය වන හෝ පිළිගනු ලබන, අදහස් කරන සහ ඇතුළත් වන මෙහි මින්මතු "දෙවන බන්ධනදායී" යනුවෙන්

සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 92/A, තිළිණගම, මීරිගම යන ස්ථානයේ පදිංචි හිහපුරගේ බුද්ධික අනුර කුමාර (ජාතික හැඳුනුම්පත් අංක 820580427V දරන) (මෙහි මින්මතු යම් අවස්ථාවල පළමුවන බන්ධනදායී සහ දෙවන බන්ධනදායී යන අය, එක්ව "බන්ධනදායීන්" යනුවෙන් සඳහන් කරනු ලැබිය යුතු) යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද;

පහත විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රවල සින්නක්කර අයිතිකරු වන "දෙවන බන්ධනදායී" විසින් ස්වකීය සින්නක්කර අයිතිවාසිකම්, හිමිකම් සහ සම්බන්ධතා ඉහත කී අංක 615, 174 සහ 223 දරන උකස් බැඳුම්කර යටතේ බැංකුව වෙත උකස් කර ඇති හෙයින් ද;

2026 අප්‍රේල් මස 26 වැනි දින වන විට ඉහත කී අංක 615, 174 සහ 223 දරන උකස් බැඳුම්කර මත බැංකුව වෙත රුපියල් මිලියන හතළිස් දෙකයි හත් ලක්ෂ පනස් තුන් දහස් තුන්සිය පනස් හතරයි ශත හැට තුනක් වූ මුදලක් (රු. 42,753,354.63) ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින හෙයින් ද;

අනතුරුව කිසියම් ගෙවීමක් (සිදුකර ඇත්නම්) එම ගෙවීම අඩු කිරීමෙන් පසුව, ප්‍රධාන පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව දරන ලද ප්‍රවාරක පිරිවැය, විකුණුම් පිරිවැය සහ වෙනත් යම් ගාස්තු ද සමග ඉහත කී රුපියල් මිලියන හතළිස් දෙකයි හත් ලක්ෂ පනස් තුන් දහස් තුන්සිය පනස් හතරයි ශත හැට තුනක් වූ මුදලක් (රු. 42,753,354.63) හෝ දේපළ වෙන්දේසි දිනය වන විට නොගෙවා ඉතිරිව පවතින එහි යම් කොටසක් සහ 2026 අප්‍රේල් මස 27 වැනි දින සිට දේපළ වෙන්දේසි දිනය තෙක් ඉහත කී අංක 615, 174 සහ 223 දරන උකස් බැඳුම්කර මත, වර්ෂයකට සියයට දාහතරයි දශම එකයි පහක් වූ (14.15%) අනුපාතිකය යටතේ රුපියල් මිලියන විසි තුනයි අටලක්ෂ තිස් හතර දහස් දෙසිය හැත්තෑ නවයයි ශත පනස් පහක් වූ (රු. 23,834,279.55) මූලික මුදල මත පොළිය ද, වර්ෂයකට සියයට දාහතයි දශම පහයි බින්දුවක් වූ (17.50%) අනුපාතිකය යටතේ රුපියල් මිලියන පහයි පන් ලක්ෂ හැත්තෑ හත් දහස් අටසිය පනස් පහයි ශත දහ අටක් වූ (රු. 5,577,855.18) මූලික මුදල මත පොළිය ද අයකර ගැනීම සඳහා ඉහත කී අංක 615, 174 සහ 223 දරන උකස් බැඳුම්කර මගින් බැංකුව වෙත උකස් කරන ලද මෙහි උපලේඛනයේ සවිස්තරාත්මකව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍ර බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි (මෙහි මින්මතු එක්ව "ප්‍රධාන පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ක්‍රියා කරමින් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

උපලේඛනය

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාවේ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 134, අස්ගිරිය උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, අස්ගිරිය ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද "කෝන්ගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. යූ. සෙනරත් විසින් සාදන ලද 2003 ජූනි මස 01 වැනි දින අංක 2207A දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද; (බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. යූ. සෙනරත් විසින් සාදන ලද 2003 මාර්තු මස 15 වැනි දින අංක 2207 දරන පිඹුරේ ලොට් අංක 1 සහ 2 ලෙස ලකුණු කර නිරූපණය කරන ලද ඉඩම් කොටස් නැවත මැනීමක් සහ ඒකාබද්ධ කිරීමක් වන) උතුරට : ඇළ ද; නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු කේ. කේ. ඒ. එස්. පද්මිණී විසින් සාදන ලද අංක 2075 දරන පිඹුරේ ලොට් A දරන ඉඩම් කොටසේ ඉතිරි බිම් ප්‍රදේශය ද; දකුණට : බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. යූ. සෙනරත් විසින් සාදන ලද අංක 2207 දරන පිඹුරේ ලොට් අංක 3 සහ ලොට් අංක 5 දරන ඉඩම් කොටස් ද; සහ බටහිරට: බලයලත් මිනින්දෝරු කේ. කේ. ඒ. එස්. පද්මිණී විසින් සාදන ලද අංක 2075 දරන පිඹුරේ ලොට් A දරන ඉඩම් කොටසේ ඉතිරි බිම් ප්‍රදේශය සහ ඇළ ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ඉහත කී අංක 2207A දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් තිස් දෙකයි දශම අටයි හතක් වූ ද (අ.0, රූ.0, පර්.32.87) ගම්පහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ K 581/34 දරන වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත්තා වූ ද, ඉහත කී ලොට් අංක 1 දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස සහ එහි පස, ඒ මත වූ ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සෑම සියලු දේ ද වේ.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාවේ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත 134, අස්ගිරිය උතුර දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, අස්ගිරිය ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද "කෝන්ගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. යූ. සෙනරත් විසින් සාදන ලද 2003 මාර්තු මස 15 වැනි දින අංක 2207 දරන පිඹුරේ ලොට් අංක 4 ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : ලොට් අංක 3 දරන ඉඩම් කොටස ද; නැගෙනහිරට : ලොට් අංක 3 දරන ඉඩම් කොටස ද; දකුණට : වමින්ද සුරවීර විසින් හිමිකම් කියනු ලබන අංක 2008 දරන පිඹුරේ ලොට් අංක 1 දරන ඉඩම් කොටස සහ පාර ද සහ බටහිරට : ලොට් අංක 6 දරන ඉඩම් කොටස ද; යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ඉහත කී අංක 2207 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් පහළොවක් වූ ද (අ.0, රූ.0, පර්. 15) ගම්පහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ K 302/129 දරන වෙළුමේ/ පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත්තා වූ ද, ඉහත කී ලොට් අංක 4 දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස සහ එහි පස, ඒ මත වූ ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සෑම සියලු දේ ද වේ.

3. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා

සීමාවේ සහ මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 134, අස්ගිරිය උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ අස්ගිරිය ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද "කෝන්ගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. යූ. සෙනරත් විසින් සාදන ලද 2003 මාර්තු මස 15 වැනි දින අංක 2207 දරන පිඹුරේ ලොට් අංක 6 ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : බලයලත් මිනින්දෝරු කේ. කේ. ඒ. එස්. පද්මිණී විසින් සාදන ලද අංක 2075 දරන පිඹුරේ ලොට් A දරන ඉඩම් කොටසේ ඉතිරි බිම් ප්‍රදේශය සහ ලොට් අංක 5 සහ ලොට් අංක 3 දරන ඉඩම් කොටස් ද; නැගෙනහිරට : ලොට් අංක 4 දරන ඉඩම් කොටස ද; දකුණට: චමින්ද සුරවීර විසින් හිමිකම් කියනු ලබන අංක 2008 දරන පිඹුරේ ලොට් අංක 1 දරන ඉඩම් කොටස ද; සහ බටහිරට: ඇළ ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ඉහත කී අංක 2207 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් පහළොවක් වූ ද (අ.0, රූ.0, පර්.15) ගම්පහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ K 302/130 දරන වෙළුමේ/ පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත්තා වූ ද, ඉහත කී ලොට් අංක 6 දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස සහ එහි පස, ඒ මත වූ ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සෑම සියලු දේ ද වේ.

පහත දැක්වෙන ඉඩම් කොටස මතින් සහ ඒ ඔස්සේ ඇති යෑම ඒමේ මාර්ග පරවශතා අයිතිය ද සමග වේ.

4. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාවේ සහ මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 134, අස්ගිරිය උතුර දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ අස්ගිරිය ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද "කෝන්ගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. යූ. සෙනරත් විසින් සාදන ලද 2003 මාර්තු මස 15 වැනි දින අංක 2207 දරන පිඹුරේ ලොට් අංක 3 ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : ලොට් අංක 1 සහ ලොට් අංක 2 දරන ඉඩම් කොටස් ද; නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු කේ. කේ. ඒ. එස්. පද්මිණී විසින් සාදන ලද අංක 2075 දරන පිඹුරේ ලොට් A දරන ඉඩම් කොටසේ ඉතිරි බිම් ප්‍රදේශය ද; දකුණට : පාර සහ ලොට් අංක 4 සහ 6 දරන ඉඩම් කොටස් ද; බටහිරට : ලොට් අංක 4, 5 සහ 1 දරන ඉඩම් කොටස් ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ඉහත කී අංක 2207 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම තුනයි හතරක් වූ ද, (අ.0, රූ.0, පර්. 7.34) ගම්පහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ K 424/148 දරන වෙළුමේ/ පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත්තා වූ ද, ඉහත කී ලොට් අංක 3 දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස ද වේ.

ප්‍රමාණයෙන් පර්චස් දශම තුනයි හයක් වූ ද (අ.0, රූ.0, පර්.0.36) බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. යූ. සෙනරත් විසින් සාදන ලද, 2003 මාර්තු මස 15 වැනි දින අංක 2207 දරන පිඹුරේ ලොට් අංක 5 (මීටර් 3ක් පළල පාර) ලෙස නිරූපණය කරන ලද ඉඩම් කොටස මතින් යාම ඒමේ මාර්ග පරවශතා අයිතිය ද සමග වේ.

තව ද, විදුලි සැපයුම් පද්ධති උපාංගය, ජල සැපයුම් පද්ධති උපාංගය, විදුලි සංදේශ උපාංගය සහ වායු සමීකරණ උපාංගය ඇතුළු ඉහත සවිස්තරාත්මකව විස්තරකර ඇති ඉඩම් කොටස සඳහා දැනට සවිකර ඇති හෝ මින්මතු කලින්කල සවිකරනු ලැබිය හැකි හෝ ස්ථිරව එකතුකර ඇති හෝ එකතු කරනු ලැබිය හැකි එක්ව හා වෙන් වෙන් වශයෙන් වූ සියලු නිශ්චල යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණ, උපකරණ, සවිකුරු සහ සවිකිරීම් සහ වෙනත් සේවාවන් ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

10 - 653

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මතය

2026 මැයි මස 20 දින පවත්වන ලද නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී පහත දැක්වෙන යෝජනා සම්මතය විශේෂයෙන්ම සහ ඒකමතිකව සම්මත කරන ලදී. එනම් ;

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ("බැංකුව") ආයතනය වෙනුවෙන් මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඊ්. එන්. ජේ. හර්ෂණී *නොහොන්* නදීකා ඒකනායක විසින් සහතික කරන ලද 2021.07.20 දින අංක 1330 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කර පවරා දෙන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරාත්මකව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය ඇපයට තබා එයට එරෙහිව ප්‍රදානය කරන ලද ණය මුදල්/ මූල්‍ය පහසුකම් මත අයවිය යුතු මුදල් ආපසු ගෙවීම නො. 121, ශාන්ත මරියා පාර, ජා - ඇල යන ලිපිනයේ පදිංචි පට්ටිවිලගේ මොහාන් ධනුෂ්ක ප්‍රනාන්දු (ණය ගැනුම්කරු) යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද;

පහත විස්තර කර ඇති දේපළෙහි සහ පරිශ්‍රයෙහි බදු ගෙවීමෙන් නිදහස් සින්නක්කර අයිතිකරු වන "ණය ගැනුම්කරු" විසින් ස්වකීය සින්නක්කර අයිතිවාසිකම්, හිමිකම් සහ සම්බන්ධතා ඉහත කී අංක 1330 දරන උකස් බැඳුම්කරය යටතේ බැංකුව වෙත උකස්කර ඇති හෙයින් ද;

2025 සැප්තැම්බර් මස 30 වැනි දිනය වන විට ඉහත කී අංක 1330 දරන උකස් බැඳුම්කරය මත බැංකුව වෙත රුපියල් මිලියන හතයි හයලක්ෂ විසිඅටදහස් පන්සිය පනස්හතරයි ශත විසිහතරක් වූ මුදලක් (රු. 7,628,554.24) ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින හෙයින් ද;

අනතුරුව කිසියම් ගෙවීමක් (සිදුකර ඇත්නම්) එම ගෙවීම අඩුකිරීමෙන් පසුව, ප්‍රධාන පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව දරන ලද ප්‍රවාරක පිරිවැය, විකුණුම් පිරිවැය සහ වෙනත් යම් ගාස්තු ද සමග ඉහත කී රුපියල් මිලියන හතයි හයලක්ෂ විසිඅටදහස් පන්සිය පනස් හතරයි ශත විසිහතරක් වූ මුදලක් (රු. 7,628,554.24) හෝ දේපළ වෙන්දේසි දිනය වන විට නොගෙවා ඉතිරිව පවතින එහි යම් කොටසක් සහ 2025 ඔක්තෝබර් මස 01 වැනි දින සිට දේපළ වෙන්දේසි දිනය තෙක්, වර්ෂයකට සියයට එකොළහයි දශම දෙකයි පහක් වූ (11.25%) අනුපාතිකය යටතේ ඉහත කී අංක 1330 දරන උකස් බැඳුම්කරය සම්බන්ධයෙන් වන විට එම උකස් බැඳුම්කරය මගින් ඇපයෙන් සුරක්ෂිත කරන ලද රුපියල් මිලියන පහයි හත්ලක්ෂ දාහතරදහස් හත්සිය අසූනවයයි ශත හැත්තෑ දෙකක් වූ (රු. 5,714,789.72) මූලික මුදල මත පොළිය ද අයකර ගැනීම සඳහා ඉහත කී උකස් බැඳුම්කරය මගින් ඉහත කී ණය මුදල්/පහසුකම් සඳහා ඇපකරයක් වශයෙන් බැංකුව වෙත උකස් කරන ලද පහත විස්තර කර ඇති දේපළෙහි සහ පරිශ්‍රයෙහි බදු ගෙවීමෙන් නිදහස් සින්නක්කර අයිතිවාසිකම්, වෙනත් යම් අයිතිවාසිකම්, හිමිකම් සහ සම්බන්ධතා ඇතුළත් වන එම දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ලොකුබණ්ඩා සේනානායක මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි (මෙහි මින්මතු එක්ව "ප්‍රධාන පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ක්‍රියාකරමින් බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, (මීගමුව ලියාපදිංචි කොට්ඨාසය ඇතුළත), අලුත්කුරු කෝරළේ, දුනගහ පත්තුවේ, කටාන ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 64A, කටාන උතුර ග්‍රාමනිලධාරී කොට්ඨාසය ඇතුළත, කටාන උතුර යන ස්ථානයේ පිහිටා ඇත්තා වූ ද, නො. 42, කොච්චිකඩේ පාර, වරිපනම් අංක 42 දරන පරිශ්‍රය වන්නා වූ ද, "මිල්ලගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු කේ. ආර්. එස්. ෆොන්සේකා විසින් සාදන ලද 2019 ජූනි මස 29 වැනි දින අංක 8118 දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස ලකුණුකර නිරූපණය කර ඇත්තා වූ ද;

උතුරට : ඒ. පී. ඇන්ටන් රොෂාන් යන අයට අයිති ඉඩම ද;

නැගෙනහිරට : මරියා ජසින්තා රොද්‍රිගු යන අයට අයිති ඉඩම සහ මෙහි ලොට් අංක 03 දරන ඉඩම් කොටස ද;

දකුණට : මෙහි ලොට් අංක 02 දරන ඉඩම් කොටස ද, (අඩි 13ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද ඉඩම් කොටස); සහ

බටහිරට : මෙහි ලොට් අංක 02 දරන ඉඩම් කොටස, (අඩි 13ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද ඉඩම් කොටස) සහ රොෂාන් චමින්ද යන අයට හා මොරීන් ඉවෝන් කමලා යන අයට අයිති ඉඩම් කොටස් ද;

යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ඉහත කී අංක 8118 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් විසි පහයි දශම හතයි පහක් (අ.0, රූ.0, පර්.25.75) හෙවත් හෙක්ටයාර් 0.06513 ක් වූ ද මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක H 521/06 දරන වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත්තා වූ ද, ඉහත කී ලොට් අංක 01 දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස සහ එහි පස මෙන් ම ඒ මත වූ ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ.

පහත දැක්වෙන ඉඩමෙන්, ඉඩම උඩින්, යටින් හෝ ඒ ඔස්සේ යෑම ඒමේ මාර්ග පරවශ්‍යතා අයිතිය ද සමග වේ; එනම් -

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, (මීගමුව ලියාපදිංචි කොට්ඨාසය ඇතුළත), අලුත්කුරු කෝරළේ, දුනගහ පත්තුවේ, කටාන ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 64A, කටාන උතුර ග්‍රාමනිලධාරී කොට්ඨාසයේ, "මිල්ලගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු කේ. ආර්. එස්. ෆොන්සේකා විසින් සාදන ලද 2019 ජූනි මස 29 වැනි දින අංක 8118 දරන පිඹුරේ ලොට් අංක 02 ලෙස ලකුණුකර නිරූපණය කර ඇත්තා වූ ද;

උතුරට : ලොට් අංක 01 ද;

නැගෙනහිරට : ලොට් අංක 03, 04 සහ 06 ද;

දකුණට : (මා. සං. අ.) පාර; සහ

බටහිරට : මරියන් දේවිකා පෙරියතම්බි, රොෂාන් චමින්ද සහ ඉවෝන් කමලා යන අයට අයිති ඉඩම් ද;

යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ඉහත කී පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් දහතුනයි දශම හතරයි බින්දුවක් වූ ද (අ.0, රූ.0, පර්.13.40) මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ H 521/09 දරන වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත්තා වූ ද, ඉහත කී ලොට් අංක 02 දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස සහ එහි පස මෙන් ම ඒ මත වූ ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ.

තව ද, විදුලි සැපයුම් පද්ධති උපාංගය, ජල සැපයුම් පද්ධති උපාංගය, විදුලි සංදේශ උපාංගය සහ වායු සමීකරණ උපාංගය ඇතුළු ඉහත සවිස්තරාත්මකව විස්තරකර ඇති ඉඩම් කොටස සඳහා දැනට සවිකර ඇති හෝ මින්මතු කලින්කල සවිකරනු ලැබිය හැකි හෝ ස්ථිරව එකතුකර ඇති හෝ එකතු කරනු ලැබිය

හැකි එක්ව හා වෙන් වෙන් වශයෙන් වූ සියලු නිශ්චල යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණ, උපකරණ, සවිකුරු සහ සවිකිරීම් සහ වෙනත් සේවාවන්ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

10 - 670

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මතය

2025 නොවැම්බර් මස 14 දින පවත්වන ලද නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී පහත දැක්වෙන යෝජනා සම්මතය විශේෂයෙන්ම සහ ඒකමතිකව සම්මත කරන ලදී. එනම් ;

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනය ("බැංකුව") ආයතනය වෙනුවෙන් ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අනුරාධා නල්ලපෙරුම විසින් සහතික කරන ලද 2019.06.04 දින අංක 577 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කර පවරා දෙන ලද මෙහි උපලේඛනයේ සවිස්තරාත්මකව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය ඇපයට තබා එයට එරෙහිව ප්‍රදානය කරන ලද ණය මුදල්/පහසුකම් මත අයවිය යුතු මුදල් ආපසු ගෙවීම ("පළමු ණයගැනුම්කරු සහ දෙවන ණය ගැනුම්කරු" මෙහි ඕන් මතු ඇතැම් අවස්ථාවල දී සාමූහිකව "ණය ගැනුම්කරුවන්" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පනියන්දුව පාර, අම්බලන්ගොඩ පදිංචි ("පළමු ණය ගැනුම්කරු වන") කුෂාන් බුද්ධකෝරාල සහ ("දෙවන ණය ගැනුම්කරු වන") බුද්ධකෝරාලලාගේ ගාමිණී ගුණසිරි යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද;

පහත විස්තර කර ඇති දේපළෙහි සහ පරිශ්‍රයෙහි බදු ගෙවීමෙන් නිදහස් සින්නක්කර අයිතිකරු වන "පළමු ණය ගැනුම්කරු" විසින් ස්වකීය බදු ගෙවීමෙන් නිදහස් සින්නක්කර අයිතිය, හිමිකම සහ සම්බන්ධතා ඉහත කී අංක 577 දරන උකස් බැඳුම්කරය යටතේ බැංකුව වෙත උකස්කර ඇති හෙයින් ද;

2025 ඔක්තෝබර් මස 03 වැනි දිනය වන විට ඉහත කී අංක 577 දරන උකස් බැඳුම්කරය මත බැංකුව වෙත රුපියල් මිලියන දාහතයි එක්ලක්ෂ දහතුන්දහස් දෙසිය නවයයි ශත අසූපහක් වූ මුදලක් (රු. 17,113,209.85) ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින හෙයින් ද;

අනතුරුව කිසියම් ගෙවීමක් (සිදුකර ඇත්නම්) එම ගෙවීම අඩුකිරීමෙන් පසුව, ප්‍රධාන පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව දරන ලද ප්‍රවාරක පිරිවැය, විකුණුම් පිරිවැය සහ වෙනත් යම් ගාස්තු ද සමග ඉහත කී රුපියල් මිලියන දාහතයි එක්ලක්ෂ දහතුන්දහස් දෙසිය නවයයි ශත අසූපහක් වූ මුදලක් (රු. 17,113,209.85) හෝ දේපළ වෙන්දේසි දිනය වන විට නොගෙවා ඉතිරිව පවතින එහි යම් කොටසක් සහ 2025 ඔක්තෝබර් මස 04 වැනි දින සිට දේපළ වෙන්දේසි දිනය තෙක් වර්ෂයකට සියයට පහළොවයි දශම අටක් වූ (15.8%) අනුපාතිකය යටතේ ඉහත කී අංක 577 දරන උකස් බැඳුම්කරය සම්බන්ධයෙන් වන විට එම උකස් බැඳුම්කරය මගින් ඇපයෙන් සුරක්ෂිත කරන ලද රුපියල් මිලියන දහයයි හත්ලක්ෂ නවදහස් පන්සිය හතලිහයි ශත දහයක් වූ (රු. 10,709,540.10) මූලික හිඟ මුදල මත පොළිය ද අයකර ගැනීම සඳහා ඉහත කී උකස් බැඳුම්කරය මගින් ඉහත කී ණය මුදල්/ පහසුකම් සඳහා ඇපකරයක් වශයෙන් බැංකුව වෙත උකස් කරන ලද පහත විස්තරකර ඇති දේපළෙහි සහ පරිශ්‍රයෙහි බදු ගෙවීමෙන් නිදහස් සින්නක්කර අයිතිය සහ වෙනත් යම් අයිතිවාසිකම්, හිමිකම් සහ සම්බන්ධතා ඇතුළත් වන එම දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ලොකුබණ්ඩා සේනානායක මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි ("ප්‍රධාන පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ තමා වෙත පැවරී ඇති බලතල යටතේ ක්‍රියාකරමින් බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අම්බලන්ගොඩ නගර සභා සීමාව ඇතුළත, අංක 82A - නම්බිමුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, නම්බිමුල්ල ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද "මගවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමේ ලොට් A දරන කොටසේ නැවත මැනීමක් වන්නා වූ ද, බලයලත් මිනින්දෝරු එස්. පී. වීරවර්ධන විසින් සාදන ලද 2018.07.02 දින අංක 5231 දරන පිඹුරේ "ලොට් A_1" ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද;

උතුරට : මාර්ගය ද;

නැගෙනහිරට : කොළඹ - ගාල්ල මහා මාර්ගය ද;

දකුණට : එම ඉඩමේ ම ලොට් 2 සහ ලොට් C ද; සහ

බටහිරට : තානායම පිහිටි ඉඩම සහ එම් ඉඩමේම ඉතිරි කොටස ද;

යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ඉහත කී අංක 5231 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම තුනක් වූ ද (අ.0, රූ.0, පර්.8.3) ඉහත කී "ලොට් A_1" දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස සහ ඒ මත වූ ගහ කොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ.

ඉහත කී ලොට් A_1 දරන ඉඩම් කොටස පහත සඳහන් ඉඩමේ නැවත මැනීමක් වේ; එනම් -

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අම්බලන්ගොඩ නගර සභා සීමාව ඇතුළත, අංක 82A - නම්බිමුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, නම්බිමුල්ල ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද "මගවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩබ්. වී. ගුණවර්ධන විසින් සාදන ලද 1935.04.07 දින අංක 170 දරන පිඹුරේ "ලොට් A" ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද (ගාල්ල දිසා අධිකරණයේ නඩු අංක 20791 දරන නඩු වාර්තාවට ගොනු කර ඇත්තා වූ ද)

උතුරට : තානායම් ගෙවත්ත සහ ගල්වැඩ බැම්ම ද;
නැගෙනහිරට : එම ඉඩමේ ම ලොට් B ද;
දකුණට : එම ඉඩමේම ලොට් C ද; සහ
බටහිරට : මාවතබොඩ වත්ත ද;

යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ඉහත කී අංක 170 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම හතයි පහක් වූ ද (අ.0, රූ.0, පර්.11.75) බලපිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ C 115/32 දරන වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත්තා වූ ද, ඉහත කී "ලොට් A" දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස සහ ඒ මත වූ ගහ කොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ.

උපාංග සමග විදුලි සැපයුම් පද්ධතිය, ජල පහසුකම් පද්ධති උපාංග, විදුලි සංදේශ උපාංගය සහ වායු සමීකරණ උපාංගය ඇතුළු සවිස්තරාත්මකව සඳහන් කර ඇති ඉඩම් කොටස සඳහා දැනට හෝ මින්මතු කලින්කළ සම්බන්ධ කරනු ලැබ ඇති හෝ ලැබිය හැකි හෝ ස්ථිරව සවි කරනු ලැබ ඇති හෝ සවි කරනු ලැබිය හැකි සියලු එක්ව හා වෙන් වෙන්ව වූ නිශ්චල යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණ, උපාංග, සවිකුරු, සවිකිරීම් සහ සේවාවන් ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

10 - 737

යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වන වගන්තිය ප්‍රකාරව යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින්මතු "යූනියන් බැංකුව" වශයෙන් හඳුන්වන,) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනාව 2026 සැප්තැම්බර් මස 30 වැනි දින ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, දෙහිවල, ශ්‍රීමත් ඩී. බී. ජයතිලක මාවත, අංක 239/2 7/4 දරන ලිපිනයේ පදිංචි සහ එම ලිපිනයේම ලියාපදිංචි අංක W/A 205298 යටතේ එම්/එස් ජුපිටර් (M/S Jupitar), යන නාමයෙන් තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන අහමඩ් ෆරීඩ් මොහමඩ් සඳත් (ජාතික හැඳුනුම්පත් අංක 197601602205 දරන) (මෙහි මින්මතු ඇතැම් තැනක "බන්ධනදායි" වශයෙන් හඳුන්වන,) යන අය විසින් කොළඹ 03, ගාලු පාර, අංක 64 දරන ලිපිනයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි සමාගම් ලියාපදිංචි කිරීමේ අංක PB676PQ දරන, යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින්මතු "යූනියන් බැංකුව" වශයෙන් හඳුන්වන,) වෙතින්, මූල්‍ය ණය පහසුකමක් ලබාගෙන ඇති බැවින් ද, එකී බන්ධනදායි විසින් ප්‍රසිද්ධ නොතාරිස් කේ. පී. නයන්ත්‍රා සහතික කරන ලද අංක 1187 සහ 2024.08.14 දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට තබා, යූනියන් බැංකුව වෙත අයවිය යුතු ඉහත කී මූල්‍ය ණය පහසුකම සහ ඒ මත උපචිත පොළිය සහ අනෙකුත් ගාස්තු ආපසු ගෙවා පියවා දැමීම පිණිස, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපළ ඇප සුරැකුමක් වශයෙන් උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද,

ඒ අනුව, ඉහත කී මූල්‍ය ණය පහසුකම මත ශ්‍රී ලංකා රුපියල් එක්කෝටි පනස් හතර ලක්ෂ හතළිස් දෙදහස් එකසිය දහතුනකුත් ශත හය (ශ්‍රීලරු. 15,442,113.06) ක මුදලක් සමන්විත වන :

I. අංක 674001000006924 දරන ණය පහසුකම මත 2026.08.19 වැනි දිනට මුළු හිඟ මුදල වන ශ්‍රී ලංකා රුපියල් හතළිස් දෙලක්ෂ අටදහස් පන්සිය නවයකුත් ශත හැත්තෑ එකක (ශ්‍රීලරු. 4,208,509.71) මුදලක් සහ ශ්‍රී ලංකා රුපියල් හතළිස් ලක්ෂ විසිතුන්දහස් තුන්සිය විසිහයකුත් ශත හතළිස් හතක (ශ්‍රීලරු. 4,023,326.47) හිඟ මුල් මුදල මත 2026.08.20 වැනි දින සිට එකී දේපළ විකිණීමේ දිනය තෙක් වසරකට 13% + 2% ක අවම පොළී අනුපාතය සහිතව වසරකට AWPLR + 2.5% අනුපාතයට (AWPLR + 2.5% p.a. with a floor rate of 13%+2% p.a.) පොළිය අයකර ගැනීම සඳහාත්;

